ලංසු සඳහා ආරාධනයයි

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

පෑලියගොඩ , රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RDP & SC) සඳහා CCTV නිරීක්ෂණ පද්ධතියක් සැලසුම් නිර්මාණය, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කරවීම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් පෑලියගොඩ , රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RDP & SC) සඳහා නිරීක්ෂණ පද්ධතියක් සැලසුම් නිර්මාණය, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කරවීම සඳහා මුදු තැබූ ලංසු කැඳවනු ලැබේ.

ප්‍රසම්පාදන අංකය	ප්‍රසම්පාදනයේ නම	ලංසු ඇපකරය (රු.)	ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව (රු.)
T/29/2026	පෑලියගොඩ , රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RDP & SC) සඳහා නිරීක්ෂණ පද්ධතියක් සැලසුම් නිර්මාණය, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කරවීම	රු. 20,000/-	රු. 3,500/-

1. ජාතික තරඟකාරී ලංසු ක්‍රියාපටිපාටිය (NCB) යටතේ ලංසු කැඳවීම සිදු කෙරේ.
2. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට සහකාර අධ්‍යක්ෂ (සැපයුම්), සැපයුම් අංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව වෙතින් වැඩදුර තොරතුරු ලබාගත හැකි අතර, 2026/11/17 දින සිට 2026/12/02 දින දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලේඛන පරීක්ෂා කළ හැක. ලංසු ලේඛන කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන www.industry.gov.lk සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය වන www.idb.gov.lk වෙතින් ද නැරඹිය හැක (නැරඹීම සඳහා පමණි). නමුත් ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන් අනිවාර්යයෙන්ම ඉහත සඳහන් කළ කාර්යාලයෙන් මිලදී ගත් ලේඛනය ඉදිරිපත් කළ යුතුය.
3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සහ රු. 3,500/- ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් පසු 2026/11/17 දින සිට 2026/12/01 දින දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ ලංසු ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් කළ යුතුය..
4. ලංසු (මුල් පිටපත සහ අනුපිටපත), 2026/12/02 දින පෙ.ව. 11.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ කාර්මික සංවර්ධන මණ්ඩලය, කටුබැද්ද, මොරටුව හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුය නැතහොත් සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව හි පිහිටි ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැමිණ සිටීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ලංසුව අඩංගු කවරයේ ඉහළ වම් කෙළවරේ නම සහ ලංසු අංකය සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
5. ලංසු භාරගැනීම අවසන් කරනු ලබන දින සිට දිනදර්ශන දින 91 ක් සඳහා ලංසු වලංගු විය යුතු අතර, සෑම ලංසුවක් සමගම ඉහත සඳහන් කළ මුදල් සඳහා වූ ලංසු ඇපකරයක් (2027/03/03 දින දක්වා වලංගු) ඉදිරිපත් කළ යුතුය. වලංගු ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් නොකරන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
6. පූර්ව ලංසු රැස්වීම 2026/11/23 දින පෙ.ව. 10.00 ට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව හි පිහිටි අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වේ.
7. වැඩදුර තොරතුරු සඳහා කරුණාකර අමතන්න : සහකාර අධ්‍යක්ෂ (සැපයුම්) දුරකථන : 011-2607004 (දිගුව- 146) / විද්‍යුත් තැපෑල : supplyidb@gmail.com හෝ සහකාර අධ්‍යක්ෂ - RPD & SC, පෑලියගොඩ, දුරකථන : 011-2930747

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු)
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.
දුරකථන / ෆැක්ස් - 011-2607004